*සැ. යු.*- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2008 වර්ෂයේ අප්‍රේල් - ජූනි කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,762 - 2012 ජූනි 08 වැනි සිකුරාදා - 2012.06.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| පනත් ... ... ... ... | — | වස්තු හංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 476 |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | 477 |

*සැ. යු.*- දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

හිස්බුල්ලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අප්‍රේල් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජූනි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීම
## කොළඹ දිසා අධිකරණයේ දී ය

නඩු අංකය - 17685/එම්බී - එදිරිව හෝමාගම දිසා අධිකරණය ඇස්කිසි අංකය - 70/2011

කොළඹ 2 හයිඩ්පාර්ක් කෝනර් අංක 97 හි ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී (පෙර කොළඹ 1 ජනාධිපති මාවතේ අංක 69 හි සෙලින්කෝ මන්දිරයේ 3 වැනි මහලේ පිහිටි සී/ස ද ෆිනෑන්ස් සමාගම/ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්)

.......................................................................... පැමිණිලිකරු.

1. අතුරුගිරිය, කොට්ටාව පාර අංක 319 හි චිත්‍රා වඩුගේ චන්ද්‍රලතා

2. අතුරුගිරිය කොට්ටාව පාර, අංක 319 හි මහවත්තගේ නන්දසේන ගුණසේකර

.......................................................................... විත්තිකරුවන්.

ඉහත අංකය දරන නඩු වාර්තාව ඇතුළත් කර ඇති වර්ෂ 2011.01.31 වැනි දිනැති තීන්දු ප්‍රකාශය මගින් රු. 2,277,096.07 ක මුදලක් සහ රු.1,908,841.43 ක මූලික ණය මුදල මත 2005.07.06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා වසරකට 21% ක පොලියක්ද තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූරණයෙන් ගෙවා නිමවන තුරු තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල මත වසරකට 21% වැඩිපුර පොලියක් ද, පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් සමස්ථ මුදල සඳහා පොළියද නඩු ගාස්තු ද ඒ සඳහා තවදුරටත් පොලිය හා ගාස්තු අයකර ගැනීමට පැමිණිලිකරුට ආඥාකොට ඇති බැවින් ද,

(අ) රු. 2,277,096.07 ක මුදලක් සහ රු.1,908,841.43 ක මූලික ණය මුදල මත වර්ෂ 2005 ක් වූ ජූලි මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා මසකට 21% ක පොළියක්ද තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමවනතුරු තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල මත වසරකට 21% වැඩි දුර පොළියක් ද, අයකර ගැනීම සඳහා විත්තිකරුවන්ට විරුද්ධව නඩු තීන්දුවක් ලබා දෙන ලෙසත්,

(ආ) මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති ඉඩම සහ දේපළ හා එය තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදිය සහ මතුවට එහි ඉදිකරනු ලබන සියලු ගොඩනැගිලිද එකී රු.2,777,096.07 ක මුදල හා ඉහත ගණනය කළ පරිදි එයට වැඩිදුර පොළියද 2004.04.29 වැනි දිනැති හා අංක 158 දරන උකස්කරය මත නඩු ගාස්තුද අයකර ගැනීම, විශේෂයෙන් බැඳී ඇති බවට හා එම දේපළ විකිණිය හැකි බවට නියෝගයක් ලබා ගැනීමට ද,

(ඇ) ගරු අධිකරණය නියම කරනු ලබන දිනයක ඉහත කී රු.2,277,096.07 ක මුදල හා ඉහත කී වැඩිදුර පොළිය හා නඩු ගාස්තු ගෙවීම පැහැර හැරියහොත් මෙහි දෙවැනි උපලේඛනයේ වඩාත් සවිස්තරාත්මකව දක්වා ඇති දේපළ විශේෂයෙන් බැඳී ඇති බවට හා ඇස්කිසි ලබාගත හැකි බවට ද ගරු අධිකරණය විසින් සුදුසු යැයි නියම කරන කොන්දේසි මත හා අධිකරණය ප්‍රමාණවත් යැයි සලකන පරිදි අඩුම තරමින් දේශීය එක් පුවත්පතක හා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ නිසි දැන්වීමකින් පසු ඉඩම පිහිටි ස්ථානයේ අධිකරණය විසින් නියම කරනු ලබන වෙන්දේසිකරුවකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය හැකි බවට ප්‍රකාශනයක් ලබා ගැනීමට ද,

(ඈ) නඩු ගාස්තු අයකර ගැනීමටත්,

පැමිණිලිකරු සහ 1 වැනි 2 වැනි විත්තිකරුවන් අතර පහත සඳහන් ආකාරයට සමථයට පත්වී ඇති සමථ කොන්දේසි පහත පරිදි -

01. මෙම සමථය අනුව පැමිණිලිකරු විත්තිකරුවන්ට විරුද්ධව පවරා ඇති පැමිණිල්ලේ පැමිණිලිකරු ඉල්ලා ඇති පරිදි නඩු තීන්දුවක් ඇතුළත් කිරීමට 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් එකඟ වූ බවත්,

02. තව ද විත්තිකරුවන් පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති මුදල් අද දින සිට මාස 01 ක් තුළ ගෙවීමට එකඟ වූ බවත්,

03. එම තීන්දු ප්‍රකාශිත මුදල 1 වැනි 2 වැනි විත්තිකරුවන් පහත සඳහන් පරිදි ගෙවීමට අපොහොසත් වුවහොත් විත්තිකරුවන්ට කිසිදු දැන්වීමක් නොමැතිව අවුරුද්දක් ගත වුවද මෙම ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ඇස්කිසි ගැනීමේ අයිතිය පැමිණිලිකරුට ඇති බවට 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් එකඟ වූ බවත්,

04. තව ද පාර්ශවකරුවන් පහත සඳහන් එකඟත්වයට ඇතුළත් වී ඇත. එනම් මෙම ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් පසුව පැමිණිලිකරුට හිස් භුක්තිය ලැබුණාට පසුව විත්තිකරුවන්ට රු.319,000 ක මුදලක් ගෙවීමට එකඟ වූ බවත්,

05. තව ද මෙම විකිණීමෙන් පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති මුදලට වඩා මුදලක් ලැබෙන්නේ නම් තීන්දු ප්‍රකාශයේ එම මුදලින් විත්තිකරුවන් නිදහස් කිරීමට පැමිණිලිකරු එකඟ වූ බවත්,

06. එසේම ඇස්කිසි ගාස්තු විත්තිකරුවන් විසින් දරා ගත යුතු බවත්,

07. ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් විත්තිකරුවන්ට අදාළ දේපළ ලන්සු තැබීමට අයිතිය ඇති බවට ද දෙපාර්ශවය එකඟ වූ බවත්,

08. කෙසේ වෙතත් පැමිණිලිකරුගේ නඩු තීන්දුව සම්බන්ධයෙන් මෙම උකසට අදාළ දේපළ පමණක් යටත්ව වන බවට ද දෙපාර්ශවය එකඟ වූ බවත්,

සමථ කොන්දේසිවලට එකඟ වන බවටත් සමථය අනුව කටයුතු කරන බවටත් නඩු වාර්තාව දෙපාර්ශවය අත්සන් තබයි.

මෙම නඩු තීන්දුව ඉටු කිරීමෙන් පසුව විත්තිකරුවන්ගේ නම සී ආර් අයි බී ඉවත් කිරීම සඳහා අදාළ ලිපි ලේඛන පැමිණිලිකරු විසින් 2 වැනි විත්තිකරුට ලබා දෙන බවට පැමිණිලිකරු එකඟ වූ බවත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

එකී මුදල සහ පොළිය නඩු ගාස්තු අය කර ගැනීම සඳහා අධිකරණය විසින් අනුමත කරන ලද එකී තීන්දු ප්‍රකාශය හා විකිණීමේ කොන්දේසි අනුව එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කිරීම සඳහා මෙම අධිකරණය විසින් ඔබ නම් කොට ඇති බැවින් ද,

එකී තීන්දු ප්‍රකාශයේ පනවා ඇති නියෝගයන්ට හා විධානයන්ට අනුකූලව සහ විකුණුම් කොන්දේසි අධිකරණය ලවා නිසි පරිදි අනුමත කරවා ගැනීමෙන් පසුව මෙම විකිණීම සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාම සඳහා ඔබට මෙයින් නියම කොට බලය පවරනු ලබන බවට මෙම නීත්‍යානුකූල ලේඛනය සාක්ෂියක් වේ.

එවැනි වෙන්දේසියක දී ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් වෙන්දේසියේ කොන්දේසි සපුරාලීමෙන් පසුව හා ගැණුම්කරු පැමිණිලිකරු වුවහොත් මෙහි හිමිවිය යුතු මුදල ඒ මත පොළිය සහ නඩු ගාස්තුවල වටිනාකම සඳහා පැමිණිලිකරුට බැර සලසා දුන් බවට සෑහීමෙන් පසු සහ ගැණුම්කරු

හෝ ගැණුම්කරුවන් තුන්වන පාර්ශවකරුවෙකු හෝ පාර්ශවකරුවන් වුවහොත් ගැණුම්කරු හෝ ගැණුම්කරුවන්ගේ වාසියට නීතියට අනුකූලව නිසි ආකෘති පත්‍රයේ අවශ්‍ය විකුණුම්කරය ලියා අත්සන් කිරීම සඳහා ද ඔබ වෙත නියම කරනු ලැබේ.

මෙම විකිණීමේ දී ඔබ විසින් අය කරනු ලබන මුදලින් සියයට විසිපහක්වත් (25%) විකිණීමේ වේලාවෙන් පසු පැය 48 ක් ගතවීමට මත්තෙන් මෙම අධිකරණය වෙත ගෙවිය යුතු අතර විකිණීමෙන් පසු ලිත් මසක් ඇතුළත ඉතිරි 75% ක මුදල ගෙවිය යුතු අතරම විකිණීමෙන් පසු දින 10 ක් ඇතුළත ඔබේ වාර්තාව මෙම අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග සම්පූර්ණ කළ විකුණුම් කොන්දේසිද විකුණුම් කොන්දේසි සම්පූර්ණ කොට ඉදිරිපත් කරන ලද ගැණුම්කරුවන් හෝ ගැණුම්කරුවන්ගෙන් කිනම් ගෙවීමක් මුදලක් හෝ මුදල් ඔබ විසින් අයකර ගන්නා ලද්දේ දැයිද ඔබ මෙම අධිකරණයට දැනුම් දිය යුතු ය.

වර්ෂ 2012 ක් වූ අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 10.00 යට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ මැද පත්තුවේ මාදුළුවාව පිහිටි වර්ෂ 1986 ක් වූ අගෝස්තු මස 08 වැනි දින ජී. කේ. සුමනදාස අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන පිළියෙල කරන ලද අංක 76/1448 දරන සැලසුම් ප්‍රකාර දවටගහලන්දවත්ත ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කැබලි අංක 5A දරන කොටසට මායිම් : උතුරට කැබලි අංක 5 සී ද, අඩිපාර සහ කැබලි අංක 4ඒ 1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට : කැබලි අංක 5 බී ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් 01 ක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම සහ එය තුළ පිහිටි සියලු ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සැම සියලු දේද සමග මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 277/264 හි ලියාපදිංචි කොට ඇත.

කේ. ආර්. දයානි පෙරේරා,
රෙජිස්ට්‍රාර්/පිස්කල්
දිසා අධිකරණය,
හෝමාගම.

වර්ෂ 2012 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින දී ය.

06-306

---

# විවිධ දැන්වීම්

## වයිට් රෝස් පදනම නීතිගත කිරීමේ පනත

ගරු වික්ටර් ඇන්තනි පෙරේරා වන මම ප්‍රකාශකර දැනුම් දෙන වග නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 48 යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන "වයිට් රෝස් පදනම නීතිගත කිරීමේ පනත" පහත සඳහන් සාමාන්‍ය විෂයයන්ගෙන් සමන්විත වේ.

01. දිවයිනේ සියලුම ප්‍රදේශවලට සිටින සීමිත පහසුකම් ඇති අය වෙනුවෙන් සමාජ සේවා කටයුතු ලබාදීමට හා විශේෂයෙන්ම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් සපුරාලීමට සහායවීම, පුහුණුව ලබාදීම හා ඔවුන්ගේ දක්ෂතාවයන් සංවර්ධනය කිරීම, රැකියා ලබාදීමට සහායවීම හා ජීවන තත්ත්වය නගාලීම.

02. ළමයින්ගේ හා තරුණයින්ගේ ජීවිතවලට බලපාන ආකාරයට විෂයානුබද්ධ නිර්මාණ හැකියාවන් සඳහා අවස්ථා ලබාදීම තුළින් මානසික හා ශාරීරික දියුණුවට ධනාත්මක වෙනසක් ඇති කිරීම.

03. විවිධ දක්ෂතා ඇති පුද්ගලයින්ට ඒවා වැඩි දියුණු කර ගැනීමට මූල්‍යමය සහාය තුළින් අවස්ථා ලබාදීම.

ගරු වික්ටර් ඇන්තනී පෙරේරා,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
පුත්තලම් දිස්ත්‍රික්කය.

06-336

## ගබඩා ව්‍යාපෘති නීතිගත කිරීමේ පනත

ගරු වික්ටර් ඇන්තනි පෙරේරා වන මම ප්‍රකාශකර දැනුම් දෙන වග නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ සමාජ නියෝග 48ට අනුකූලව "ගබඩා ව්‍යාපෘති නීතිගත කිරීමේ පනත" නමින් පනතක් පාර්ලිමේන්තුවට යෝජනා කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අතර එහි පහත සඳහන් අරමුණු ඇතුළත් වේ.

01. දිවයිනේ සියලුම ප්‍රදේශවලට සිටින සීමිත පහසුකම් ඇති අය වෙනුවෙන් සමාජ සේවා කටයුතු ලබාදීමට හා විශේෂයෙන්ම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් සපුරාලීමට සහායවීම, පුහුණුව ලබාදීම හා ඔවුන්ගේ දක්ෂතාවයන් සංවර්ධනය කිරීම, රැකියා ලබාදීමට සහායවීම හා ජීවන තත්ත්වය නගාලීම.

02. නාගරික හා ගම්බද ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහායවීමෙන් ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීමට හා ඒ තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාලීම.

03. විවිධ ආගමික හා සංස්කෘතික පසුබිම්වලට අයත් සමාජයේ ළමුන් සහ නොයෙක් තරුණ කොටස් එකට මුණගැසී ක්‍රියා කිරීමට සලස්වා සමාජයේ එක්සත්භාවය රැකීම හා නොයෙක් නිර්මාණාත්මක හැකියාවන් ඉදිරිපත් කිරීමට වේදිකාවක් සකසා දීම.

ගරු වික්ටර් ඇන්තනී පෙරේරා,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
පුත්තලම් දිස්ත්‍රික්කය.

06-337

**බරීරා මුස්ලිම් කාන්තා අරාබි විදුහල**

**සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

එම්. එස්. තවුෆීක් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48(1) යටතේ බරීරා මුස්ලිම් කාන්තා අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නාවූ එකී විදුහල සංස්ථාගත කිරීමයි.

1. ඉස්ලාමීය 'ෂාරියා' නීතිය යටතේ සමාජයට මගපෙන්වීමට ඉස්ලාමීය දේවධර්මවාදීන් බිහි කිරීම.
2. ඉස්ලාමීය ධර්මය ආරක්‍ෂා කිරීම.

යනාදිය වේ.

එම්. එස්. තවුෆීක්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

06-310

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.